මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා නිර්මාණාත්මක කර්මාන්තවල වර්තමාන තත්වය පිළිබඳ මූලික අධ්‍යයනයකි. මෙමගින් ඔවුන්ගේ කාර්යයේ ශක්තිමත් 'නිර්මාණාත්මක' අංග පිළිබඳව සළකා බැලීම, ඔවුන්ගේ ප්‍රධාන අභියෝග සහ වර්තමාන තත්වය ගැන අවබෝධයක් ගොඩ නැගීමේ පළමු උත්සාහයයි. මෙම කර්මාන්ත වලට වර්ධනය වන ගෝලීය වැදගත්කමක් ඇති අතර එබැවින් මෙම වාර්තාව මගින් ක්ෂේත්‍රයේ උප අංශ තුළ පවතින අභියෝග කිහිපයක් සඳහා ද නිර්දේශ ඉදිරිපත් කරයි, එමෙන්ම සමස්තයක් ලෙස මෙම අංශයේ වර්ධනය සඳහා වන නිර්දේශ ලබා දෙයි. සංස්කෘතික හා නිර්මාණාත්මක කර්මාන්ත යනු පුද්ගල නිර්මාණශීලිත්වය, කුසලතා සහ දක්ෂතා, මෙන්ම පරම්පරාගත හැකියාවන් තුළින් රැකියා උත්පාදනය කිරීමේ ක්‍රමවේදයක් වේ. බුද්ධිමය දේපල සුරාකෑම (DCMS,1998) පිළිබඳවද මෙහිදී විමසා බැලිය යුතුය. මෙම වාර්තාවේ අරමුණු සඳහා, අපි සිංගප්පූරු ආකෘතිය අනුගමනය කරමින් හා සංවර්ධනය කරමින් පහත දැක්වෙන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළෙමු.

කලාව සහ සංස්කෘතිය

ඡායාරූප ශිල්පය

දෘශ්‍ය කලා

රංග කලාව

සාහිත්‍යය

කලාව, උරුමය

සහ අත්කම්

නිර්මාණ

මෘදුකාංග,

වෙළඳ ප්‍රචාරණය සහ වෙළඳ නාමකරණය,

වාස්තු විද්‍යාව

ගෘහ අලංකරණය

ග්‍රැෆික් නිර්මාණකරණය

කාර්මික නිර්මාණය - Industrial Design

විලාසිතා නිර්මාණය

මාධ්‍ය

ප්‍රකාශන

රූපවාහිනිය සහ ගුවන් විදුලිය

ඩිජිටල් මාධ්‍ය

චිත්‍රපට සහ වීඩියෝ

මේ එකිනෙක පිළිබඳව අධ්‍යයනය සඳහා විවිධ පර්යේෂණ ක්‍රම භාවිතා කොට තිබේ. : නවතම ශ්‍රම බලකා සමීක්ෂණය විශ්ලේෂණය කිරීම (සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2017 ආ) සහ අදාළ ද්විතීයික කරුණු අධ්‍යයනය.;

පළාත් නවයෙන් හතක් පුරා නිර්මාණ 492 ක් සමඟ සමීක්ෂණයක් පවත්වන ලදී; කණ්ඩායම් අටක් කේන්ද්‍රකරගත් 75 දෙනෙකු සහභාගී වූ සාකච්ඡා; සහ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි මාර්ගෝපදේශයක් භාවිතා කරමින් ගුණාත්මක ගැඹුරු සම්මුඛ සාකච්ඡා 40 ක්. මීට අමතරව නිර්මාණාත්මක කර්මාන්ත නියෝජිතයින්ගෙන් සහ දේශීය හා විදේශීය විශේෂඥයින්ගේ සමන්විත පුද්ගලයන් 12 දෙනෙකුගෙන් යුත් මෙහෙයුම් කමිටුවක් ද පිහිටුවන ලදී. මේ කමිටුව සම්බන්ධ වූයේ මේ වාර්තාව සඳහා නිර්මාණාත්මක කර්මාන්ත හඳුනා ගැනීමට සහ උපදේශණ සඳහායි. කාණ්ඩ අටක් මත උප අංශ විශ්ලේෂණය සිදු කරන ලදී: ඒ අතර රංගන සහ දෘශ්‍ය කලා; වෙළඳ දැන්වීම්; ප්‍රකාශන සහ සාහිත්‍යය; ඡායාරූප ශිල්පය; අත්කම්; විලාසිතා නිර්මාණය; තොරතුරු තාක්ෂණය (ග්‍රැෆික් නිර්මාණය, පරිඝණක ක්‍රීඩා සහ ඩිජිටල් නිර්මාණ); සහ වාස්තු විද්‍යාව සහ ගෘහ අලංකරණ නිර්මාණ යන ක්ෂේත්‍රයන් විය.

ශ්‍රී ලංකාවේ නිර්මාණාත්ම කර්මාන්ත ආර්ථිකය 2010 සහ 2014 අතර ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරයි. දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය ඇමරිකානු ඩොලර් මිලියන 433.62 සිට ඇමරිකානු ඩොලර් මිලියන 845.41 දක්වා ඉහළ ගොස් ඇත. වෙනත් ආකාරයකට පැවසුවහොත් භාණ්ඩ හා සේවා අපනයනයෙන් 95% ක වර්ධනයක් ගණනය කෙරේ. කෙසේ වුවත් අඛණ්ඩවම ඉහළ යන ආනයන හේතුවෙන් වසර කිහිපයක් තුළදී ආර්ථිකයේ ඍණාත්මක සමතුලිතතාවයක් ඇති වී තිබේ. 2014 දී දළ දේශීය නිෂ්පාදිතයට ඇස්තමේන්තුගත දායකත්වය 1.06 ක්% වේ. (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නිර්මාණාත්මක භාණ්ඩ හා සේවා අපනයන සමඟ ගණනය කිරීම) .

අපගේ සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 4.6% ක් පමණක් අපනයනය කළ බව සැලකිය යුතු ය. මෙහි තේරුම 1.06% ක දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය ගෘහස්ථ සංසරණය සඳහා නොගිණිය හැකි තරම් කුඩා අගයක් බවයි. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 5.3% ක් කියා සිටියේ තමන් දේශීය හා විදේශීය යන දෙඅංශයේම සේවාදායකයින්ට සේවා සැපයූ බවයි. ප්‍රධාන අපනයන රටවල් වූයේ ඕස්ට්‍රේලියාව (ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 13% ක්), ඇමරිකා එක්සත් ජනපදය (9%), ඉන්දියාව (9%) සහ කැනඩාව (9%).

ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ශ්‍රම බලකායෙන් 3% (2.9%) පමණ නිර්මාණාත්මක කර්මාන්තවලට සම්බන්ධ වේ. සංසන්ධනය කිරීමේදී , රජයේ ආර්ථික සංවර්ධනය කේන්ද්‍ර කරගත්, සංචාරක කර්මාන්තයේ 1.9% ක් පමණ ශ්‍රම බලකායක් සේවය කරයි. නිර්මාණකරුවන්ගේ ප්‍රමාණය වූ 3%න්, 36ක් කාන්තාවන් වේ, එමෙන්ම 67% ක සේවකයින් වයස 24ත් 55 ත් අතර වේ. අති බහුතරයක් වූ (71%) ක පෞද්ගලික අංශයේ සේවය කරන පිරිස පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය ආයතන යටතේ මෙහෙයවීමකට විරුද්ධය. එනම් මෙම අංශයේ සේවය කරන්නන් රාජ්‍ය සම්පත් පහත හෙළනවාට වඩා බදුකරණය හරහා ධනය උත්පාදනය කරමින් මහජන ඉපැයීම් නිර්මාණය කරන්නෝ වෙති. අත්‍යවශයෙන්ම, මෙම අංශයේ ස්වයං රැකියා වියුක්තිය ඉහළ මට්ටමක පවතී. ශ්‍රම බලකායෙන් 40% ක් 'සේවකයින් ' වීම සහ සේවායෝජක (5%) හෝ වැටුප් රහිත පවුලේ කර්මාන්තයට සම්බන්ධ වන සේවකයින් (7%) තමන් 'ස්වයං රැකියාලාභීන් ' ලෙස හඳුනාගෙන ඇත, සමීක්ෂණයට ලක් වූවන් අතර බුද්ධිමය දේපල ඉහල නැංවීම සහ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම පිලිබඳ දැනුවත්භාවය දුර්වලය.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 8.8% ක් පමණ ගණනකට කිනම් ආකාරයක හෝ බුද්ධිමය දේපල ආරක්ෂාවක් ඇති අතර ඉන් 48% කට ප්‍රකාශන හිමිකම් ඇත. 10% පේටන්ට් බලපත්‍ර ද, 26% ක් වෙළඳ ලකුණු ද, 16% කට වෙනත් ශක්‍යතාවන්ද ඇත. එක් එක් අංශයන් ප්‍රකාශන හිමිකම් සහ වෙළඳ ලකුණු ලබාගෙන ඇති අතර පේටන්ට් බලපත්‍ර ලබාගෙන ඇත්තේ උප අංශ ස්වල්පයක නිරත වන්නන් පමණි.

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ඉහළ අධ්‍යාපනයක් ලබාගත් සහ අඩු අධ්‍යාපනයක් ලබාගත් සැවොම නිර්මාණාත්මක අංශයේ සේවකයන් වීමට හැකිය. මෙම ශ්‍රම බලකායෙන් 78% ක් සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති අතර (වයස අවුරුදු 16 දී ලබාගත් පළමු පොදු විභාගය) ; 14% ක් ප්‍රාථමික අධ්‍යාපනය දක්වා පමණක් ඉගෙන ගෙන තිබේ. 22% ක් උසස් පාසල් අධ්‍යාපනය (උසස් පෙළ) හෝ ඉන් ඔබ්බට සම්පූර්ණ කර ඇත.

නිර්මාණාත්මක අංශයේ මධ්‍යන්‍යය මාසික වැටුප මසකට LKR 29,418 (ඇමරිකානු ඩොලර් 192.40) වන අතර ජාතික මධ්‍යන්‍යය LKR 33,894 (ඇමරිකානු ඩොලර් 221.70) වේ. කම්කරුවන්ට යහපත් වැටුපක් ලබා දීමට හා දිගින් දිගටම ක්ෂේත්‍රයේ රඳවා ගැනීමට මෙම අංශයට ප්‍රබල හැකියාවක් ඇති බව පෙන්වමින් අත්කම් සහ නිෂ්පාදනයන්, ග්‍රැෆික් සහ විලාසිතා නිර්මාණ ක්ෂේත්‍රවල නියුතුවූවන් හැර අනෙකුත් සියලුම අංශ සාමාන්‍යයෙන් ඩොලර් 40,000 (ඇමරිකානු ඩොලර් 261.60) ට වඩා උපයයි.

නිර්මාණාත්මක කර්මාන්තවල ශ්‍රම බලකායෙන් වැඩි ප්‍රමාණයක් වයස අවුරුදු 24 ත් 55 ත් අතර අය වෙති. එය ජාතික ප්‍රවණතාවක් බව පිළිබිඹු කරයි. තොරතුරු තාක්ෂණ, නිර්මාණ සහ දැන්වීම අංශවලට වයස 45 ට අඩු පිරිස පිළිවෙලින් 82%, 76% සහ 74% යන ප්‍රමාණයන්ගෙන් අයත් වේ.

මෙයට හේතුව ඉහළ ඉපැයීමේ හැකියාව මෙන්ම කීර්තිමත් නාගරික සමාගම් වල වැඩ කිරීමට හැකිවීම නිසා විය හැකිය. වයස අවුරුදු 55 ට වැඩි ශිල්පීන් ඇත්තේ 24% ක් පමණි තරුණ පරම්පරාවන් අතර ශිල්පය පිලිබඳ උනන්දුව අඩුවෙමින් පවතින බව පෙන්නුම් කෙරේ. එසේ වීමට හේතුව දුර්වල සේවා තත්වයන් සහ අඩු වැටුප් නිසා හෝ මහලු වියේ ආදායම් ක්‍රමයක් ලෙස මෙය සලකන නිසා විය හැකිය. මෙම අංශයේ සංවර්ධනය වයස්ගත වීමට ආසන්නව සිටින්නන්ගේ අර්බුධය සඳහා ශ්‍රී ලංකාවට වැදගත් විසඳුමක් විය හැකිය. එසේම එය මහලු වියට පැමිණෙන්නන්ගේ ආදායම් මාර්ගයක් සඳහා විකල්පයක්ද සපයනු ඇත.